# දෙවියන් ප්‍රශ්නයක් ද ?

දෙවියන් සැබෑ ලෙසම වැඩ සිටී ද? ආගම් මිනිසාව යුද්ධය වැනි විනාශකාරී ක්‍රියා වලට පොළඹවයි ද? මෙවන් නොයෙකුත් තර්ක විතර්ක මතු කරමින් ඍජුව හා වක්‍රව දේවවාදී ආගම්, විශේෂයෙන් ක්‍රිස්තියානි ආගම අවතක්සේරු කරන ලිපි බොහොමයක් පසුග ය මාස කිහිපය තුළ ඕස්ට්‍රේලියාවේ සිංහල පුවත්පත් වල දක්නට ලැබිණි. මෙම ලිපි වලට පිළිතුරක් සැපයීමේ අරමුණින් ම නොවූවත් මට හැඟෙන අදහස් කීපයක් ද පාඨකයා හමුවේ තැබීමට අවශ්‍යයැයි සිතේ.

දෙවියන් ඇතැයි 'විද්‍යාත්මකව' ඔප්පු කරන්නට මම නොවෙහෙසෙමි. මට ඒ කළ හැක්කේද නොවෙයි. විද්‍යාවත් ආගමත් යනු එකක් නොව දෙකකි. ආගම් වල පවතින්නා වූ සියළු විශ්වාස විද්‍යාත්මකව පැහැදිලි කළ හැකි වූයේ නම් ඒවා තවදුරටත් ආගම් නොවේ. විද්‍යාව යනු පංචේන්ද්‍රියන්ගෙන් ලබන්නාවූ දැනුම මත රඳා පවතින්නකි. අපගේ පංචේන්ද්‍රියන්ට ගෝචර නොවූ සියල්ල අසත්‍යයැයි හෝ නොපවතීයැයි කිව හැකිද? මේ විශ්වය තුළ 'විද්‍යාත්මකව' පැහැදිලි කළ නොහැකි බලවේග හා සංසිද්ධීන් කොතෙකුත් තිබේ. පැහැදිලි කළ නොහැකි වූ පමණින් අපට ඒවා ප්‍රතික්ෂේප කළ හැකි නොවේ. ආගම් වල ඇති සමහර ඉගැන්වීම් විද්‍යාවෙන් තහවුරු වේ යැයි උදම් අනන සමහරුන්ට අමතකවන දෙයක් ඇත. විද්‍යාව අද නිවැරදි යැයි සම්මත කරන දේ හෙට එය එසේ නොව මෙසේ යැයි අළුත් කරයි. එවැනි අවස්ථාවලට උදාහරණ ඕනෑ තරම් ඇත. ආගමක ඇති සත්‍යතාවන් එසේ වෙනස්වන සුළු නොවේ.

දෙවියන් කෙරෙහි විශ්වාස කිරීම පංචේන්ද්‍රියන්ට (ඒ හෙයින් ම විද්‍යාවට ) හසුනොවන අත්දැකීමකි. (මේ පිළිබඳව සවිස්තරාත්මක ලිපියක් මාස කීපයකට උඩදී අතුල මංචනායක මහතා විසින් පළකර තිබිණි.) දෙවියන් කෙරෙහි විශ්වාසය තබන්නෝ දෙවියන්ගේ වැඩසිටීම අත්දකිති. විශ්වාසය තුළ දෙවියන් අත් දුටු පුද්ගලයින්ගේ සාක්ෂි ඕනෑ තරම් අප අවට සමාජයෙන් සොයාගත හැක. විද්‍යාව හා තාක්ෂණය රොකට් වේගයෙන් දියුණු වෙද්දිත් ලෝකය පුරා දේවවාදී ආගම් නොසෙල් වී පවතින්නේ මේ නිසාය. 'ලෝක ධර්මතා ගැන කම්පා නොවන්නැ'යි බුදුන් වහන්සේ වදාළසේක. එනම් මිනිසාට වෙනස් කළ නොහැකි, තේරුම්ගත නොහැකි ක්‍රියාවලින් විශ්වය තුළ ඇත. කිසියම් කෙනෙක් මෙම ක්‍රියාවලීන් මෙහෙයවන බලවේගය 'දෙවියන් ' යැයි විශ්වාස කරයි නම් එය ප්‍රතික්ෂේප කළ හැකි ද?

**දේවවාදී ආගම් විසින් මිනිසාව යුද්ධයට පොළඹවනු ලබනු බවට හාස්‍යජනක චෝදනාවක් ද එල්ලකර තිබිණි. උදාහරණ ලෙස ලේඛකයා දක්වා තිබුණේ ඉන්දියාවේ හින්දු මුස්ලිම් ගැටුම් හා කුරුස යුද්ධ යනාදියයි. නිරන්තරයෙන් පුවත්පත් වල පිටු පුරවන සමහරුන්ට නොවැටහෙන සරල සත්‍ය නම් මෙම විනාශකාරී සිදුවීම් හැම එකක්ම ඇති වූයේ අදාළ ආගම් වල ගැබ්වන ධර්මයේ වරදින් නොව ඒවා නාමමාත්‍රිකව පමණක් පිළිපදින අනුගාමිකයින්ගේ වරදින් බවය. කිතු දහමේ උගන්වන්නේ එක් කම්මුලකට පහර දුන්නොත් අනෙක් කම්මුලත් හරවන්නට ය. සතුරාට ද සමාව දෙන්නට ය.  බුදුන් වහන්සේ උගැන්වූයේ වෛරයෙන් වෛරය නොසන්සිඳේ කියාය.**

දේවවාදී ආගම් විසින් මිනිසාව යුද්ධයට පොළඹවනු ලබනු බවට හාස්‍යජනක චෝදනාවක් ද එල්ලකර තිබිණි. උදාහරණ ලෙස ලේඛකයා දක්වා තිබුණේ ඉන්දියාවේ හින්දු මුස්ලිම් ගැටුම් හා කුරුස යුද්ධ යනාදියයි. නිරන්තරයෙන් පුවත්පත් වල පිටු පුරවන සමහරුන්ට නොවැටහෙන සරල සත්‍ය නම් මෙම විනාශකාරී සිදුවීම් හැම එකක්ම ඇති වූයේ අදාළ ආගම් වල ගැබ්වන ධර්මයේ වරදින් නොව ඒවා නාමමාත්‍රිකව පමණක් පිළිපදින අනුගාමිකයින්ගේ වරදින් බවය. කිතු දහමේ උගන්වන්නේ එක් කම්මුලකට පහර දුන්නොත් අනෙක් කම්මුලත් හරවන්නට ය. සතුරාට ද සමාව දෙන්නට ය.  බුදුන් වහන්සේ උගැන්වූයේ වෛරයෙන් වෛරය නොසන්සිඳේ කියාය. සියළු සත්වයන්හට මෛත්‍රිය කරන්නටය. ආගම් ලොවට දෙනු ලැබුවේ  දෙවියන්, බුදුන් විසින් උවත් ඒවා පිළිපදින මනුෂ්‍යයින් දුර්වල සිත් ඇත්තෝ වෙති. මිනිස් සිත් තුළ ඊර්ෂ්‍යාව, තෘෂ්ණාව, වෛරය, ආත්මාර්ථය ආදී අනේක විධ නපුර සැරිසරයි. ආගමේ නමින් ද, ජාතියේ නමින් ද, දේශයේ නමින් ද මිනිසුන් යුධ වදින්නේ මේ නිසා ය. වරද ආගම් මත පැටවීම සාධාරණ නොවේ.

ආගම් හෙළා දකිමින් මිනිසුන් ආගම් වලින් ඈත් කරන්නට උත්සාහ කරන්නන්ට මම අනුකම්පා කරමි. මේ ආගම් වලට ළංවීමට කාලයයි! ආගම් වල (මෙහිදී මම බෞද්ධාගම ද දර්ශනයක් පමණක් නොව ආගමක් ලෙස සළකමි. ඒ එසේ යැයි මම පුද්ගලිකව විශ්වාස කරමි.) සැබෑ හරය මිනිස්න්ට කා වැද්දිය යුතු කාලයයි. සෑම ආගමකම ඇති සියළු වටිනාකම් එක්කර ගත්කළ ලැබෙන අවසාන ඵලය ආදරය නොවේ ද? ආත්මාර්ථ කාමී නොවන, ප්‍රතිලාබයක් බලාපොරොත්තු

24 වන පිටුවට

**සුසංග කොස්තා**

Lead Accounting & Taxation Services
Public Accountant and Registered Tax Agent

Services
- Tax Returns
  Individual / Investment Property / Partnership / Company / Trust
- Accounting/ Bookkeeping
- Preparation of Business Activity Statements(BAS)
- Tax / Business Advice
- Personal Service

Refunds within 14 days
Tax Returns
2008

ශ්‍රී ලාංකික ඔබට සුහද සේවය

Appointments
03 9544 4995 | 0402 846 676
Fax 03 9544 4997 | 3 Mobile

L. A. Dayananda Wimalasiri
B.Com, M.Com, M.Bus, Ad.Dip.Acct.

Office
1/1324 Centre Rd
Clayton VIC 3169

After Hours
7 Whitton Court
Rowville VIC 3178

leadtax@iprimus.com.au

NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA

Lead Design

YSL Migration Services
Yashodhara Sarachchandra Liyanaarachchi
Migration Agent Reg: 07 46956

Offering you advice and guidance on
General Skilled Migration, Student visa application assistance, Spouse and Family visas

Tel: 03 8794 9818 | 0430 359 006 :Mob
26 Sallybrook Circuit, Narre Warren VIC 3805
Email: yslmigration@ipriumus.com.au

Lead Design